# ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ අධ්‍යාපන රටාව සහ වර්තමාන බටහිර අධ්‍යාපන රටාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

**කළුබෝවිටියන සෝරත හිමි**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ අධ්‍යාපන රටාව වූ කලි එය සම්පූර්ණයෙන් ම ආධ්‍යාත්මිකත්වය මූලික කර ගෙන පැවැති අතර එය මුළුමනින් ම බුදු සමය මුල් කොට ගෙන ගොඩනැගුණකි. එහි දී ආධ්‍යාත්මික සංවර්ධනය මූලික වූ අතර භෞතික විෂයක්ෂේත්‍රයන් පිළිබඳව ද අවධානය යොමු කර ඇත. මහ විහාර හා අභයගිරි අධ්‍යාපන ආයතනයන්හි ක්‍රියාත්මක වූ විෂය මාලාව එයට සාක්ෂි සපය යි. මහ විහාරය කේන්ද්‍ර කර ගෙන ලෝකෝත්තර ජීවිතයට අවශ්‍ය ප්‍රතිපදාවන් පුහුණු කළ අතර අභයගිරිය කේන්ද්‍ර කර ගෙන ලෞකික ජීවිතයට අවශ්‍ය කුසලතාවන් පුහුණු කරන ලදි. වර්තමාන සමාජයේ අධ්‍යාපනය පිළිබඳ ඉතා උනන්දුවක් සෑම කෙනෙකු තුළ ම පවතින අතර ඒ නිසා ම මෙය තරගකාරී රටාවකට අවතීර්ණ වී ඇත. එම තරගකාරී බව විවිධ හේතු සාධක මත පදනම් වී පවතී. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් අපේක්ෂා කරනුයේ වර්තමාන තරගකාරී අධ්‍යාපනය රටාව සහ ලක්දිව පැවැති බෞද්ධ අධ්‍යාපන රටාව පිළිබඳ තුලනාත්මක විමර්ශනයක් සිදු කිරීම ය.

**පර්යේෂණය අරමුණු**

- වර්තමාන බටහිර අධ්‍යාපන රටාවේ පවතින තරගකාරී ස්වභාවය හඳුනා ගැනීම
- තරගකාරී අධ්‍යාපනයෙන් වර්තමාන අධ්‍යාපනික අරමුණු කෙතෙක් දුරට ඉටු වී තිබේ දැයි විමසීම
- අධ්‍යාපනයෙන් අපේක්ෂිත යහපත් සමාජයක් ගොඩනැගී තිබේ දැයි විමසීම.
- පැරණි බෞද්ධ අධ්‍යාපනයේ මගපෙන්වීම් වර්තමාන අධ්‍යාපනයට යොදා ගත හැකි ආකාරය විමසීම

**පර්යේෂණ ක්‍රමවේදය**

ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර අධ්‍යයනයෙන් දත්ත රැස් කිරීම සිදු කරන අතර ප්‍රමාණාත්මක දත්ත ප්‍රස්තාර භාවිතයෙනුත් ගුණාත්මක දත්ත තේමාකරණය යටතේත් විශ්ලේෂණය සිදු කොට අනාවරණ සොයාගනු ලබයි.

**ප්‍රතිඵල සාකච්ඡාව**

වර්තමාන බටහිර අධ්‍යාපන රටාව බෙහෙවින් තරගකාරී ස්වභාවයකට පත්ව ඇත. එය දරුවන්ගේ අධ්‍යාපනය පමණක් නො ව දෙමව්පියන්ට ද දැඩි බලපෑම් කරන තත්ත්වයකට පත්ව ඇත. අධ්‍යාපනය භෞතික විෂයක්ෂේත්‍ර පමණක් ප්‍රගුණ කරන ස්වභාවයකට පත්ව ඇත. බටහිර අධ්‍යාපනික සංකල්ප තුළ උපයෝගිතා අධ්‍යාපනික සංකල්පවලට වඩාත් නැඹුරු වුව ද පෙරදිග අධ්‍යාපනය තුළ දැකිය හැකි ලක්ෂණය වන්නේ ආධ්‍යාත්මික සංවර්ධනය වඩාත් අවධාරණය වීම යි. නමුත් ඊට ප්‍රතිපක්ෂව වර්ධනය වන වර්තමාන බටහිර තරගකාරී අධ්‍යාපනයේ පහත ලක්ෂණ ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි ය.

- දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ දී සාදාචාරාත්මක බව අමතක කොට තරගකාරී මානසිකත්වයක් ගොඩනැගීම.
- ග්‍රාමීය හා නාගරික වශයෙන් අධ්‍යාපනය ලබන පාසල් සඳහා තරගකාරී බවක් ඇති වීම.
- තරගකාරී ජනප්‍රිය පාසල්වල අධ්‍යාපනය ඉතා හොඳින් සිදු වන බව ඒත්තු ගැන්වීම.
- ළමුන් තුළ කුඩා අවධියේ පටන් අනෙකා පරයා යෑමේ සිතුවිලි ගොඩනැංවීම.
- දරුවනගේ ආවේදන, මනෝචාලක ක්ෂේත්‍ර අමතක කොට ප්‍රජානන ක්ෂේත්‍රයට පමණක් අවධානය ලබා දීම.
- සමස්ත අධ්‍යාපනික රටාව තුළ ආධ්‍යාත්මික සංවර්ධනය ප්‍රායෝගික තලයකට ගෙන ඒමට දක්වන අසමාර්ථතාව.

වර්තමානයේ අධ්‍යාපනය ලැබීම දැඩි තරගකාරී තලයකට පිවිස ඇත. දෙමව්පියෝ තම දරුවන් නොයෙක් ආකාරයෙන් ඒ සඳහා යොමු කරවති. කුඩා දරුවා පාසලට ප්‍රවිෂ්ටවීමත් සමග තරගකාරී ලෙස අධ්‍යාපනය ලබාදීමට ඔවුන් පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු කිරීම අනිවාර්ය සාධකයක් ලෙස සිතීමට දෙමව්පියෝ පෙළඹෙති. ඒ නිසා දරුවාට ළමා කාලය තුළ ක්‍රීඩා කිරීමට, මිතුරන් ඇසුරු කිරීමට, වැඩිහිටියන් ඇසුරු කිරීමට, දහම් අධ්‍යාපනය ලැබීමට හා පරිසරයට සංවේදී වීම වැනි කාර්යයන් අහිමි වී ඇත. ඒ වෙනුවට දැඩි වගකීමකින් හා කැපවීමකින් යුතු අධ්‍යාපනික කාර්යවල නිරත වීමට සිදුව ඇත. අධ්‍යාපනය යනු පන්ති කාමරයේ දී ම ලබන අත්දැකීමක් නො වේ. කුඩා කල සමාජානුයෝජනය උදෙසා බරපතළ කාර්යභාරයක් තමා ජීවත් වන පරිසරයෙන් හා වැඩිහිටියන්ගෙන් සිදු වේ. නමුත් පවතින වර්තමාන බටහිර අධ්‍යාපනය තුළ ඒ සඳහා ඇති ඉඩප්‍රස්තා සීමා වී ඇත. ළමයින්ට ළමා ලෝකයේ සුන්දරත්වය විඳීම වෙනුවට අධ්‍යාපනය වෙනුවෙන් දැඩි වගකීමකින් හා කැපවීමකින් කටයුතු කිරීමට සිදුව ඇති නිසා තමා ජීවත් වන පරිසරයෙන් සිදුවන චිත්තවේග පාලනයට හුරු වීම හා ප්‍රායෝගික අත්දැකීම් ලැබීම අහිමි වී ඇත. දරුවන් අධ්‍යාපනය ලබන පාසල තීරණය කරන්නේ ඔවුන් ඉපදීමට ද පෙරාතුව සිට ම දෙමව්පියෝ ඒ සඳහා තම වාසස්ථාන පවා වෙනස් කරමින් අසත්‍ය ලිපි ලේඛන සකස් කරමින් දරුවාගේ අනාගතය සැළසුම් කරති. දරුවන්ට කුඩා කළ සිට අසත්‍ය දේ ප්‍රකාශ කිරීමට යොමු කර වන්නේ දෙමව්පියන් හා

වැඩිහිටියන් විසිනි. ඒ අනුව සදාචාරාත්මක බව තරගකාරී අධ්‍යාපනයේ මුල සිට ම පිරිහීමට පත්වන බව පැහැදිලි ය.

ලක්දිව පැවති බෞද්ධ අධ්‍යාපන රටාව තුළ සදාචාරාත්මක හැසිරීම ඉතා ඉහළින් අගය කෙරිණි. සදාචාරය ඉතා සියුම් ලෙස සෑම අවස්ථාවක දී ම ආරක්ෂා කිරීමට අනුබල ලැබුණි ගුරු ශිෂ්‍ය සම්බන්ධය සෑම විට ම ගෞරවය හා සදාචාරාත්මක බව ආරක්ෂා වන පරිදි සිදු විය. වර්තමාන සමාජයේ ජනප්‍රිය පාසල් ඉතා ඉහළ අධ්‍යාපනයක් ලැබෙතැයි අපේක්ෂා කළ ද එය දැනුම පදනම් කර ගත් විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයක් වෙතට නැඹුරු වෙමින් පවතී. අධ්‍යාපනය විභාග සමත් වීම පමණක් නො වන බව මෙහිලා අවධාරණය කළ යුතු යි. බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළ දැනුමට වඩා ප්‍රායෝගිකත්වය පැසසුම්ට ලක් විය. ත්‍රිපිටකය කට පාඩමින් කියවනවාට වඩා එක් අධිගමයක් හෝ ලබා ගැනීම උසස් වන බව දක්වන ලද්දේ ඒ අනුව ය. සදාචාරාත්මක බව කොතරම් අගය කෙරුණ ද යත් එක් අවස්ථාවක ගුරුවරයා තම සිසුවාගෙන් කමටහන් ලබා ගැනීමෙන් ඒ බව පැහැදිලි වෙයි. එහෙත් වර්තමාන බටහිර අධ්‍යාපන රටාව තුළ ආධ්‍යාත්මික සංවර්ධනයට එතරම් අවස්ථාවක් ලැබෙන්නේ ද යන්න ගැටලුවකි. වර්තමාන බටහිර අධ්‍යාපන රටාව තුළ සදාචාරාත්මක බව ප්‍රායෝගික තලයකට ගෙන ඒමට අපොහොසත් වී ඇත. වැඩිහිටියන් තුළ මෙන් ම දරුවන් තුළ ද ව්‍යාජත්වයට මුල්තැන ලැබෙමින් පවතින පරිසරයක් ගොඩනැගෙමින් පවතී. අල්ලස, දූෂණය වැනි සදාචාර විරෝධී ක්‍රියා වැඩි වෙමින් පවතී. නොඉවසිලිමත් බව කලහකාරී බව හා තරගකාරී බව දරුවන් තුළ මෙන් ම වැඩිහිටියන් තුළ ද වර්ධනය වෙමින් පවතී.

බෞද්ධ අධ්‍යාපන රටාව තුළ පැවති මූලික ලක්ෂණය වූයේ දැඩි ශික්ෂණයක් තිබේ දැයි පරික්ෂා කොට අධ්‍යාපනය ලබා දීමට යොමු කිරීමයි. ලක්දිව බෞද්ධ අධ්‍යාපනය ද ඒ මග ගිය බව පැහැදිලි ය. ඒ සඳහා වතාවත් උපයෝගී කොට ගෙන ඇත. ඇතැම් අවස්ථාවල සිසුවාගේ හැසිරීම් ගුරුවරයාගේ අධීක්ෂණයට ලක්ව ඇත. වර්තමාන බටහිර අධ්‍යාපනය තුළ සිසුවාට අවවාද කිරීම් පවා නොරුස්සන තත්ත්වයකට පත්ව ඇත. දෙමාපිය, ගුරුවර අවවාද නිසා සියදිවි තොර කර ගැනීමට සිසුහු පෙළඹෙති. එමෙන් ම ගුරුවරුන්ට විරුද්ධව නඩු මගට පවා යන අවස්ථා බහුලව දැකිය හැකි ය. එනම් චිත්තවේග පාලනයට වර්තමාන අධ්‍යාපනයෙන් ලැබෙන ඉඩප්‍රස්තා අඩු බව ඉන් පැහැදිලි වෙයි.

**නිගමනය**

සමාජයේ කුමන අවධියක වුව ද මනා යහපැවැත්ම උදෙසා සදාචාරාත්මක බව අවශ්‍ය වේ. සදාචාරයෙන් තොර අධ්‍යාපනය නිෂ්ඵල ය. යහපත් පුරවැසියකු බිහි කිරීමේ පරමාර්ථය ගිලිහී යාමට හේතු වේ. තරගකාරීත්වය ඇති කළ යුත්තේ තමා තුළ මිස අන් අය සමඟ නොවේ. මෙම තරගකාරීත්වය යහපත ජය ගැනීමටත් අයහපත පරාජය කිරීමටත් විය යුතු ය. ගුණධර්ම අධ්‍යාපනයේ ම කොටසක් ලෙසත් එය සියලූ විෂයන්ගෙන් අවධාරණය වන බවට පත් විය යුතු ය. සදාචාරාත්මක ජීවන දර්ශනයක් ගොඩනැගෙන්නේ එවිට ය. බෞද්ධ අධ්‍යාපනයෙන් අවධාරණය වන්නේ මනා ගුණධර්මවලින් පෝෂිත සබුද්ධික පුද්ගලයෙකු සමාජගත කිරීම ය. නමුත් එයට සාපේක්ෂව බටහිර අධ්‍යාපනය තුළින් අපේක්ෂා කෙරෙන්නේ විද්‍යාව පදනම් කර ගත් පුද්ගලයෙකු

සමාජගත කිරීම ය. ඒ අනුව මෙම පෙර අපර දෙදිග අධ්‍යාපනය තුළින් සමාජයට යහපත් පුරවැසියෙකු බිහි කිරීම අපේක්ෂාව විය යුතු ය. එවිට අධ්‍යාපනයෙන් අපේක්ෂිත ඉලක්ක ඉටු කර ගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ** අධ්‍යාත්මිකත්වය, තුලනාත්මක, අධ්‍යාපනය, විෂය මාලාව

**ආශ්‍රිත ග්‍රන්ථ**

අදිකාරම්, ඊ.ඩබ්ලිව්. (1969). පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය. කොළඹඃ ජී.කේ.ජී. ජයවර්ධන.

ඤාණිම හිමි, කැන්දගොල්ලේ. (2014). 'බෞද්ධ අධ්‍යාපනය හා එහි අපේක්ෂිත අරමුණු'. වාසනා, සමරසිංහ හසන්ත.

ජයසේන, අශෝකා. (2010). අධ්‍යාපන සමාජ විද්‍යාව. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විමලවංසසූරිය, අයි.බී. (2001). පිරිවෙන් අධ්‍යාපන ලිපි. වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණ ශිල්පියෝ.

සීලානන්ද හිමි, රදලියද්දේ. (2014). සිරිලක පිරුවන් කළමනාකරණ සංග්‍රහය. නුගේගොඩඃ කර්තෘ ප්‍රකාශන.

බෞද්ධ අධ්‍යාපන දර්ශන අධ්‍යයන, (සංස්). විහාරස්ථ දායක සභාවේ ප්‍රකාශනයකි.